දැන්වීමයි

කොළඹ මහා නගර සභාව

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ III ශ්‍රේණියේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා වන සීමිත බඳවාගැනීම - 2026

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) බර **යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු** තනතුර සඳහා සුදුසුකම්ලත් **අභ්‍යන්තර අයදුම්කරුවන්** වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල (කොළඹ මහා නගර සභාවේ) ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර සේවකයින්ට මේ සඳහා ඉල්ලුම් කල හැකිය. මේම තනතුර සඳහා ඉල්ලුම් කිරීමට මේ සමඟ දැක්වෙන ආදර්ශ ආකෘතිය අනුව, A4 ප්‍රමාණයේ කඩදාසි වල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙල කරගත් අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශයද සමඟ **2026.07.31** දිනට පෙර නාගරික ලේකම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමි.

I. තනතුරු නාමය :- බර යන්ත්‍රෝපකරණ ක්‍රියකරු

II. බඳවාගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

III. වැටුප් පරිමාණය :- PL 3 - 2025 (රා.ප.ව 10/2025 අනුව)
රු.42,780 – 10x490 – 10x540 – 10x590 – 12x630 – 66,540/-

IV. වයස් සීමාව :- දැනටමත් පළාත් සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවන බැවින් වයස් සීමා අදාළ නොවේ.

V. බඳවා ගැනීමේ ක්‍රමය :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලද ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවාගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී සලකා බලන අවශ්‍යතාද මෙහිදී සලකා බැලේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	උපරිම ලකුණු ප්‍රමාණය	තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය
මාර්ග නීති පිලිබඳ දැනුම පරීක්ෂා කිරීම	30	50%
යාන්ත්‍රික ක්‍රියාකාරීත්වය හා එහි පැවැත්ම පිලිබඳ දැනුම පරීක්ෂා කිරීම	50	
ප්‍රායෝගික පරීක්ෂණය	15	
පෞරුෂත්වය	5	

VI. තනතුරට අදාළ අධ්‍යාපන, වෘත්තීය, වෙනත් සුදුසුකම් හා පලපුරුද්ද :-

අධ්‍යාපන සුදුසුකම්	වෘත්තීය සුදුසුකම්	පලපුරුද්ද	වෙනත් සුදුසුකම්
අ.පො.ස.(සා/පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 2ක් සහිතව විෂයන් 6ක් සමක්ව තිබීම. (මින් විෂයන් 5ක් එකවර සමත් විය යුතුය)	(i) බර වාහන රියදුරු බලපත්‍රය (කාර බර හොන්ඩර් 34 වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රෙලර් සහ මැෂින් 32ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම් සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාව පිලිබඳ සහතිකයක් හෝ "ඒ" පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව "ඩී" පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය. (ii) අවම උස අඩි 5ක් විය යුතුය. (iii) යන්ත්‍රෝපකරණ / ගල්රෝල් ක්‍රියාකරවීම් පිලිබඳව තෘතීක හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 4 මට්ටමට අදාල සහතිකපතක් තිබිය යුතුය. (iv) මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිලිබඳ මූලික අවබෝධයක් තිබිය යුතුය.	(i) ප.පා.ආයතනයක PL1/PL2 තනතුරක ස්ථීර කර තිබීම (ii) ඉහත (i) හි දැක්වෙන තනතුරක සේවා කාලය වසර 3ක් සම්පූර්ණ කර තිබීම (iii) බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා එම යන්ත්‍ර ක්‍රියාකරවීම් පිලිබඳ මාස 06ක පලපුරුද්දක් ලබා තිබීම	බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම. කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන අවසාන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම

VII. මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය.

VIII. අයදුම්කරනු ලබන තනතුර අයදුම්පතෙහි පැහැදිලිව දක්වා තිබිය යුතුය අතර, එක් අයදුම්කරුවකු එක් තනතුරකට වඩා අයදුම්කරනු ලබන්නේ නම්, එම එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.

IX. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන, අයදුම්පත් කැඳවන අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද කොළඹ මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වන්නේය. 2026.07.31 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් වල අත්හැරීම් හා ප්‍රමාද දෝෂයන් පිළිබඳ වගකීම් ඒ ඒ දෙපාර්තමේන්තුව වෙත පැවරේ.

ඒ. ඩී. එස්. රෝහණ
නාගරික කොමසාරිස් (රා.ඉ.)
කොළඹ මහා නගර සභාව

ඒ.ඩී.එස්.රෝහණ,
නාගරික කොමසාරිස් (රා.ඉ)කොළඹ මහා නගර සභාව
කොළඹ මහා නගර සභාව.

2026 ජූලි මස 14 වන දින
කොළඹ මහා නගර සභාව
නාගරික කොමසාරිස් කාර්යාලයේදිය.